ප්‍රසම්පාදන දැන්වීමයි

**තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**

**ජාතික යොවුන් සේනාංකය**

**ජාතික යොවුන් සේනාංක පළාත් කාර්යාලයන්හි ප්‍රයෝජනය සඳහා** මාස 08 ක **කාල සීමාවකට මාසික කුලී පදනම මත වාහන 09 ක් සපයා ගැනීම - 2025/2026**

**කොන්ත්‍රාත් අංකය YC/2/4/2025/S/08 (දේශීය අරමුදල් රු.මි.5.4)**

ජාතික තරඟකාරී ලංසු කැඳවීම අංක - 02

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික යොවුන් සේනාංකයේ පහත සඳහන් පළාත් කාර්යාල 09 ක් සඳහා අවශ්‍ය වාහන 2025.08.01 දින සිට 2026.03.31 දින දක්වා මාස 08 ක කාල සීමාවක් සඳහා මාසික කුලී පදනම මත ලබා ගැනීමට, සුදුසුකම්ලත් වාහන සැපයුම්කරුවන්ගෙන්/ආයතන වලින් 2025.06.26 දින සිට 2025.07.18 දින පෙ.ව. 11.00 දක්වා මෙයින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | පළාත් කාර්යාලය | පිහිටි ස්ථානය |
|---|---|---|
| 01 | උතුරු පළාත් කාර්යාලය | වවුනියාව ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 02 | දකුණු පළාත් කාර්යාලය | වීරකැටිය ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 03 | බස්නාහිර පළාත් කාර්යාලය | යක්කල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 04 | නැගෙනහිර පළාත් කාර්යාලය | ත්‍රිකුණාමලය ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 05 | උතුරු මැද පළාත් කාර්යාලය | කැකිරාව ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 06 | වයඹ පළාත් කාර්යාලය | වාරියපොල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 07 | සබරගමුව පළාත් කාර්යාලය | කෑගල්ල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 08 | ඌව පළාත් කාර්යාලය | වැල්ලවාය ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |
| 09 | මධ්‍යම පළාත් කාර්යාලය | සෙංකඩගල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය |

2. අදාල සේවාව ලංසු ආකෘතියේ අමුණා ඇති විස්තරයන්ට අනුව සැපයිය යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු.1,000.00 ක ලංසු ගාස්තුවක් ගෙවිය යුතු වේ.(එක් එක් පළාත සඳහා වෙන වෙනම ගාස්තු ගෙවා ලංසුපත් මිලදී ගත යුතුය) එම මුදල 2025.06.26 දින සිට 2025.07.17 දින දක්වා රජයේ වැඩ කරන කාර්යාල දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ ගිණුම් අංශයේ සරප් වෙත ගෙවා ලදුපත ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසුපත් ලබා ගත හැකි අතර, ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ ආරක්ෂක අංශ කවුළුවේ තබා ඇති ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය. (ලංසුපත් ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය).

3. ඉදිරිපත් කර ඇති කොන්දේසිවලට අනුව පැහැදිලිව ලංසු ඉදිරිපත් කළ යුතු අතර, මුද්‍රා තබන ලද ලංසුපත් අනු පිටපත ද සහිතව ලියාපදිංචි තැපැලෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු), ජාතික යොවුන් සේනාංක මූලස්ථානය, අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට 2025.07.18 දින පෙ.ව. 11.00 ට පෙර ලැබෙන සේ එවීමට හෝ ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ බිම් මහලේ ප්‍රධාන ශ්‍රවණාගාරය අසළ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටියට බහාලීමට කටයුතු කළ

හැක. එදිනම එනම් 2025.07.18 දින පෙ.ව.11.00 ට ලංසු පත් වැසූ වහාම ජාතික යොවුන් සේනාංක මූලස්ථාන ශ්‍රවණාගාරයේදී එම ලංසුපත් විවෘත කරනු ලැබේ.

4. ලංසුපත් සමඟ ලංසු ගාස්තු ගෙවූ බවට වන කුවිතාන්සියේ මුල් පිටපත සමඟ ලංසුකරු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලැබූ වාණිජ බැංකුවක් විසින් ලංසුපත් විවෘත කරන ලද දිනයේ සිට එනම් **2025.07.18** දින සිට **2025.10.16** දින දක්වා වලංගු වන සේ **සභාපති, ජාතික යොවුන් සේනාංකය, අංක 420,බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන නමින් ලබා ගත් එක් එක් පළාත වෙනුවෙන් රුපියල් හාරදහස් පන්සියය (රු.4,500.00) ක වටිනාකමින් යුත් එක් එක් පළාත වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

5. ලංසුපත් සමඟ ලංසු ගාස්තු ගෙවූ බවට වන කුවිතාන්සියේ මුල් පිටපත සහ පහත සඳහන් ලියකියවිලි වල පැහැදිළි ඡායා පිටපත් ලංසුකරු විසින් සත්‍ය පිටපත් බවට සහතික කොට අමුණා එවිය යුතුය. අවශ්‍ය විටකදී එම ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

- වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපතක්.
- පූර්ණ රක්ෂණ සහතිකයේ සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපතක්.
- මෙම වර්ෂයට අදාළ වාහනයේ අදායම් බලපත්‍රයේ සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපත.
- වැට් බද්ද සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම සහතිකයේ සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපතක් / නිදහස් කිරීමේ සහතිකය.

**6. 2025.07.07 වන දින පෙ.ව. 11.00 ට ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේදී පෙර අවබෝධාත්මක සාකච්ඡාවක් (Pre- Bid Meeting) පැවැත්වේ.**

7. ඉදිරිපත් කරන ලද මිල ගණන් ලංසු පත් විවෘත කරන ලද දිනයේ සිට එනම් 2025.07.18 දින සිට 2025.10.02 දින දක්වා දින 77 ක් වලංගු විය යුතුය.

8. ඉහත 4 හා 5 වන ඡේදයේ සඳහන් ලියකියවිලි ඉදිරිපත් නොකරන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. මේ පිළිබඳ අවසන් තීරණය ජාතික යොවුන් සේනාංක දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු) සතුවේ.

10. මේ සබැඳිව විමසීම් වෙතොත් දු.අ. 011-2 688 885/011-2 690 294 මඟින් ජාතික යොවුන් සේනාංක සහකාර අධ්‍යක්ෂ ( මූල්‍ය) ඇමතිය හැක.

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු),
ජාතික යොවුන් සේනාංක මූලස්ථානය,
අංක 420,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
2025.06.26